## අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන් සම්බන්ධයෙන් ඇති පැමිණිලි සහ තොරතුරු ඇතුළත් ලැයිස්තුව

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) විසින් සිය කාර්යාලය වෙත ලැබී තිබෙන පැමිණිලි සහ තොරතුරු මත පදනම්ව අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන්ගේ ලැයිස්තුව කොළඹ පිහිටි OMP ප්‍රධාන කාර්යාලයේදී සහ මඩකලපුව, යාපනය, මන්නාරම සහ මාතර පිහිටි ප්‍රාදේශීය කාර්යාල වලදී පරීක්ෂා කළ හැකිය.

### ලැයිස්තුවේ ඇතුළත් කර ඇති තොරතුරු OMP කාර්යාලයට ලැබුනේ කෙසේද?

මෙම ලැයිස්තුව සකස් කර ඇත්තේ

i) OMP කාර්යාලය වෙත සෘජුවම ලැබී ඇති සියලුම පැමිණිලි;

ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය විසින් එක්රැස් කර, ඉන් අනතුරුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට යොමු කළ පැමිණිලි;

iii) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ඉල්ලීම් ප්‍රකාරව ක්‍රියාන්විතයේ නියැලී සිටියදී අතුරුදහන් වූ සිය සාමාජිකයන් පිළිබඳව ත්‍රිවිධ හමුදාව විසින් සපයන ලද තොරතුරු ඇතුළත් කිරීමෙනි.

ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ පොලිස් නිලධාරීන්ගේ ලැයිස්තුව OMP වෙත ලබා දී නොමැත.

### ලැයිස්තුවේ ඇතුළත් කර ඇත්තේ කාවද?

සෑම දිස්ත්‍රික්කයකටම එක් වෙළුමක් බැගින්, පැමිණිල්ල කරන ලද තැනැත්තා පදිංචිව සිටින දිස්ත්‍රික්කයට අනුව මෙම ලැයිස්තුව වර්ගීකරණය කර ඇත. තවද, ක්‍රියාන්විතයේ නියැලී සිටියදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ තොරතුරු ඇතුළත් වෙළුමක් වෙනම සකස් කර ඇත.

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ 27 වන වගන්තියට අනුව, ක්‍රියාන්විතයේ අතුරුදහන් වූ සන්නද්ධ හමුදාවල හා පොලිසියේ සාමාජිකයින් ඇතුළු සන්නද්ධ ගැටුම්වලදී අතුරුදහන් වූ හෝ දේශපාලන නොසන්සුන්තාවයන් හෝ සිවිල් කැරලි කෝලාහල අතරතුරදී අතුරුදහන් වූ හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමක් හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් OMP හි කාර්යභාරයට ඇතුළත් වේ.

OMP හි කාර්යභාරය, නිශ්චිත කාල පරිච්ඡේදයකට, ප්‍රජාවකට හෝ කලාපයකට පමණක් සීමා නොවේ.

OMP හි කාර්යභාරයට ඇතුළත් අතුරුදහන් වීම් සහ OMP පනතට අදාළ වන්නේද යන්න තීරණය කිරීම සඳහා වැඩිදුර තොරතුරු අවශ්‍ය වන අතුරුදහන් වීම් සම්බන්ධ පැමිණිලිවලට අදාළ දත්ත ලැයිස්තුවේ අන්තර්ගත කර ඇත. OMP හි කාර්යභාරයට අදාළ නොවන අතුරුදහන් වීම් සම්බන්ධ පැමිණිලි සහ තොරතුරු (උදා: සුනාමි ව්‍යසනය නිසා සිදු වූ අතුරුදහන් වීම්) ලැයිස්තුවේ ඇතුළත් නොවේ.

යම් අතුරුදහන් වීමක් OMP හි කාර්යභාරයට අයත් නොවන්නේ නම්, OMP විසින් අදාළ පවුලේ සාමාජිකයින්ට ඒ පිළිබඳව දැනුම් දීමට කටයුතු කර ඇත. අප වෙත සපයන ලද තොරතුරු අපැහැදිලි හෝ ප්‍රමාණවත් නොවූ අවස්ථාවලදී, OMP විසින් වැඩිදුර තොරතුරු ඉල්ලා ඇත.

**ලැයිස්තුවේ ඇතුළත් කර ඇති තොරතුරු මොනවාද?**

ලැයිස්තුවේ පහත සඳහන් තොරතුරු ඇතුළත් කර ඇත.

i) අතුරුදහන් වූ හෝ අතුරුදහන් කරවන ලද තැනැත්තාට ලබා දී ඇති යොමු අංකය
ii) එම තැනැත්තාගේ නම ඉංග්‍රීසි බසින් සහ සිංහල හෝ දෙමළ බසින්
iii) එම තැනැත්තා අතුරුදහන් වූ දිනය
iv) එම තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි දිස්ත්‍රික්කය.

OMP වෙත පැමිණිල්ලක් හෝ තොරතුරු සිංහල හෝ දෙමළ භාෂාවෙන් ලබා දී ඇති විට, අතුරුදහන් වූ හෝ අතුරුදහන් කරවන ලද තැනැත්තාගේ නමෙහි අක්ෂර වින්‍යාසය OMP වෙත වාර්තා වූ ආකාරයට සඳහන් කර ඇත.

එවැනි අවස්ථාවන්හිදී, එම තැනැත්තාගේ නම, පිළිගත් අක්ෂර වින්‍යාස ක්‍රමයකට අනුකූලව ලැයිස්තුවේ පහසුවෙන් සෙවීමට හැකි වන පරිදි ඇතුළත් කර ඇත.

OMP වෙත පැමිණිල්ලක් හෝ තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දී ඇති විට, අතුරුදහන් වූ හෝ අතුරුදහන් කරවන ලද තැනැත්තාගේ නම OMP වෙත වාර්තා වූ ආකාරයටම සඳහන් කර ඇත.

**ලැයිස්තුව සකස් කිරීමේ ක්‍රියාවලිය කුමක්ද?**

OMP පනතේ 10(1)(ඉ) වගන්තිය යටතේ, අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන් පිළිබඳ දත්ත එක්රැස් කිරීමේ හා කේන්ද්‍රගත කිරීමේ කාර්යය OMP කාර්යාලයට පැවරී ඇත.

මෙම ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන් හා සම්බන්ධ දත්ත එක්රැස් කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියේ එක් කොටසකි. එමඟින් OMP කාර්යාලයට අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද සියලු දෙනාගේ දත්ත ඇතුළත් සවිස්තරාත්මක ලැයිස්තුවක් සකස් කළ හැකිවනු ඇත.

2020 පෙබරවාරි මාසයේදී OMP කාර්යාලය සිය ලැයිස්තුව සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයින්ව OMP කාර්යාලය විසින් දැනුවත් කරනු ලැබුවේ ඔවුන්ගේ ආදරණීයයන් පිළිබඳ තොරතුරු සමාලෝචනය කිරීම සඳහා OMP හා සම්බන්ධ වන ලෙසයි. ඊට සමගාමීව, තොරතුරු වල අනුපිටපත් ඇති වීම වලක්වා ගැනීම සඳහා OMP විසින් අභ්‍යන්තර සත්‍යාපන ක්‍රියාවලියක නිරතව සිටියි.

**ලැයිස්තුව පරීක්ෂා කිරීමෙන් පවුල්වලට ගත හැකි පියවර මොනවාද?**

ලැයිස්තුවේ සටහන් කර ඇති තොරතුරු පරීක්ෂා කිරීමට සහ තිබිය හැකි ඕනෑම ගැටළුවක් OMP වෙත වාර්තා කිරීමට පවුල් වල සාමාජිකයින්හට OMP ආරාධනා කර සිටියි.

**අතුරුදහන් වූ හෝ අතුරුදහන් කරවන ලද තැනැත්තෙකුගේ තොරතුරු ලැයිස්තුවේ ඇතුළත් නොවී ඇත්නම්, ඔබ කුමක් කළ යුතුද?**

ඒ පිළිබඳව කරුණාකර OMP කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට වාර්තා කරන්න. ලැයිස්තුව නැවත පරීක්ෂා කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.

ඔබ ලැයිස්තුවේ ඇතුලත් කර ඇති දිස්ත්‍රික්කයක ජීවත් වන පවුලේ සාමාජිකයෙකු වුවත්, අතුරුදහන් වූ ඔබගේ ආදරණීයයාගේ තොරතුරු එහි ඇතුළත් කර නොමැති නම්, කරුණාකර OMP වෙත ඒ පිළිබඳ ව පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න.

**ලැයිස්තුව පරීක්ෂා කිරීමෙන් මහජනතාවට ගත හැකි පියවර මොනවාද?**

ලැයිස්තුවේ ඇතුළත් කර ඇති අතුරුදහන් වූ හෝ අතුරුදහන් කරවන ලද තැනැත්තෙකුට අත් වූ ඉරණම පිළිබඳ තොරතුරු ඇත්නම්, එවැනි තොරතුරු ලිඛිතව OMP වෙත ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටියි.

**OMP විසින් සිය කාර්යභාරය ඉටු කිරීමට ලැයිස්තුව භාවිතා කරන්නේ කෙසේද?**

අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන් සම්බන්ධ විමර්ශන කොමිෂන් සභා ගණනාවක් අතීතයේ පත් කර තිබුනද, අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන් පිළිබඳ තොරතුරු ඒකාබද්ධ කොට සකස් කරන ලද නිල වාර්තාවක් ශ්‍රී ලංකාවේ මේ දක්වා ඉදිරිපත් වී නොමැත. මෙම ලැයිස්තුව ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන් පිළිබඳ නිල සහ පුළුල් වාර්තාවක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ එක් තීරණාත්මක සංධිස්ථානයකි.

OMP හි කාර්යභාරයට ඇතුළත් වන අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන් සම්බන්ධ ඒකාබද්ධ ලැයිස්තුවක් සකස් කිරීම තුළින්, විමසීම් හා විමර්ශන පැවැත්වීමට, අභ්‍යන්තර ක්‍රියාදාමයන් සංවර්ධනය කිරීමට සහ අතුරුදහන් වූ සහ අතුරුදහන් කරවන ලද තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට OMP කාර්යාලයට හැකි වනු ඇත.